# පැතිකඩ



ආචාර්ය **පාලිත ගනේවත්ත**

## සොඳුරු හදක් ඇති කවියෙක්

'පැතිකඩ' තීරය අරඹමින් ඔස්ට්‍රේලියාවේ අප අතර වාසය කරන කවියෙකුගේ අළුත්ම නිර්මාණය ගැන මගේ සිතේ පහලවුණු සිතිවිලි සමුදායක් ගෙන හැර දක්වන්නට සිතිනි. කවියා නම් පහත් නුවර වාසය කරන සුනිල් ගෝවින්නගේ මහතාය. ඔහුගේ අන්තිම නිර්මාණය නම් ''මතක පිළිරුවී" නැමැති කාව්‍ය සංග්‍රහයයි.

සුනිල් ගෝවින්නගේ කවියාගේ පළමු කාව්‍ය සංග්‍රහය මතක දිවයින නමින් 2006 දී පළවිය. සුනිල්ගේ ප්‍රථම ඉංග්‍රීසි කාව්‍ය සංග්‍රහය WHITE MASK නමින් 2004 දී පළවිය. මීට අමතරව BLACK SWANS AND OTHER STORIES නමින් කෙටි කතා සංග්‍රහය 2002 දී මුද්‍රණයෙන් නිකුත්විය.

මතක දිවයින ආරම්භයේදී පොතට සටහන-ක් ලියන සුනිල් පළ කළ වක් අදහසක් කෙරෙහි මගේ අවධානය යොමු විය. ඉංග්‍රීසි බස හසුරවන අපේ මට්ටමට වඩා හාත්පසින්ම වෙනස් වූ සමාජ සංස්කෘතික පසුබිමක් අයත් මෙරට දිවි ගෙවමින් සිංහල සාහිත්‍යකරනයේ රැඳී සිටීම, සුදු ඩොලර් සොයන්නටත්, ළමුන්ට 'හොඳ' අධ්‍යාපනයක් ලබා දීම සඳහාත් පැමිණි ගමනක නිරතවන අයකුගේ චරිතයේ ඇති ප්‍රතිවිරෝධීභාවය නිසා ඇතිවන්නක්ද යන පැනය නිරන්තරයෙන් තම සිතේ පැන නගින බව සුනිල් පවසයි. මෙරට සිට සිංහල බසින්

*<u>එකම ක්ෂේත්‍රයේ නිර්මාණයේ යෙදෙන සහෝදර නිර්මාණකරුවන්ට මං අහුරන සමාජ පරිසරයක හැදුන වැඩුන අප බොහෝ දෙනෙකුට සුනිල්ගේ මේ ගුණාංගය ඉතා දුර්ලභ මහත්මා ගතියක් ලෙස පෙනීයාම අරුමයක් නොවේ.</u>*

සාහිත්‍ය කටයුතුවල යෙදෙන අප බොහෝ දෙනෙකු තුළ මේ සිතිවිලි පහළ වනු ඇතැයි මම සිතමි.

සුනිල් ගෝවින්නගේ කවියා විසින් පසුගිය සියවසේ හැත්තෑව දශකයේ සිට මේ දක්වා ලියූ කවි 62ක් මතක මතක පිළුරුවී සංග්‍රහයට ඇතුළත් කර ඇත. 'පැරණි ලෝකය' 'නව ලෝකය' මතක දිවයිනට ගිය විට ලියූ කවි දිනෙන් දින හා 'අනාගත කවි' යනුවෙන් උප මාතෘකා පහක් යටතේ මෙම කවි වෙනස් කර ඇත. දශක හතරක් තිස්සේ ලියවුන මෙම කාව්‍ය තුළින් කතුවරයාට සඳහන් කර ඇති පරිදි ඔහුගේ මනෝභාවයන් වෙනස් වූ ආකාරයන් ගැන අවබෝධයක් ලබාගත හැකිය. 'මතක පිළුරුවී' යන නමින් ද ධ්වනිත වන පරිදි සංග්‍රහයේ ඇතුලත් කාව්‍ය නිර්මාණවල මූලික තේමාව ලෙස මා දකින්නේ මව්රටින් බැහැරව (විප්‍රවාසී) වෙසෙන කවියෙකුගේ අත්දැකීම්ය. මෙම කාව්‍ය සංග්‍රහයට පසුවනක් සපයන රසික සූරියආරච්චි කවියා පවසන අන්දමට මෙම කාව්‍ය සංග්‍රහයේ මූලික දැකීම ශෝකී වෘතාන්තයක ස්වරූපයක් ගනී.

මානව දයාවෙන් පිරුණු ප්‍රලුල් දෘෂ්ඨියකින් ලෝකය දකින්නට හැකිවීම උසස් කවියෙකු සතු ගුණාංගයකි. සුනිල් මේ උත්තම ගුණය උරුමකරගත් කවියෙකු බව මේ කාව්‍ය සංග්‍රහයේ 'කවියා' නමින් හඳුන්වා ඇති පළමු පද පෙළෙන්ම හෙළිවෙයි.

ලොව දස අත විසිරී ඇති  
සුදු කළු වූ මිනිසුන් සැම  
ලේ නෑයන් වූ මා හට  
මව්පිය නෑයන් කුමට ද ?

විප්‍රවාසී කවියෙකුගේ මනෝභාවය මනාව හෙළිකරන කවි කිහිපයක්ම මේ කාව්‍ය සංග්‍රහයට ඇතුළත් වී තිබේ. 'උරුමය සහ කවි සිසිල' නම් වූ කවිය එක් නිදසුනකි.

......... සුදු වෙරළ සොයාගෙන  
මහ ඉසුරු පතා ගෙන  
ජය බියෙන් මිදෙන්නට  
උර දරා දරු දෙදෙන.......  
දුකින් දැවී මා නිවස  
කවි සිසිල රැඳී ඇත  
කවි ලියා දුක් මකා  
වෙසෙමි මම නුදුරු රට

ප්‍රතිභාපූර්ණ කවියෙකු සතු අනිවාර්ය ගුණයක් වන ධ්වනිතාර්ථ නඟන බස් වහරක් උපයෝගී කර ගැනීම සුනිල්ගේ කාව්‍ය සංග්‍රහයේ විශේෂ ලක්‍ෂණයක් ලෙස හැඳින්විය හැකිය. මව්බිමෙන් බැහැර වූ රටක නුහුරු සංකල්පනයන් කවිබසට නැගීමේදී ඉංග්‍රීසි බස්වහර ඒ අයුරින්ම යොදා ගැනීමට කවිය උත්සුක වී ඇත. එවන් තත්වයක් සාවධානව කියවීමේදී පෙනී යන්නේ ඉංග්‍රීසි වහර සිංහල බසට පෙරළා කවියට යෙදීමට තැත් කළහොත්, එම කවියේ ව්‍යංගාර්ථයට ඉන් බාධාවක් වන බවයි. වින්ටර් වැස්ස, වින්ටර් රාත්‍රිය, 'ටේක් අප්' නෝ පේ ආදී වදන් සුනිල් ඉතා ශූර ලෙස තම කාව්‍ය නිර්මාණවලට උපයෝගී කරගෙන ඇත.

සිංහල ජනවහර හා ජනකවියෙන් සුනිල් ගෝවින්නගේ කවිය ලියූ චමත්කාරය පිළිඹිබු වන නිර්මාණ කිහිපයක් ද මතක පිළිරුව කාව්‍ය සංග්‍රහයට ඇතුලත්ය. 'ඔබ ජන කවියක්', 'පිරිත් නුවර ජන කවි' , 'සුනාමි කවි' මෙයට නිදසුන් ලෙස දැකිවිය හැකිය.

ගොළු මුහුදත් තරණය කොට පැමිණි රට  
සුදු තිසරුත් කළු පැහැගත් සොඳුරු රට  
දරුවන් අපේ සොරකම් කළ අරුම රට  
පෙර පින් බලෙන් අප පණ රැකි සොඳුරු රට

'පර්ත් නුවර ජන කවි' නැමැති කාව්‍ය නිර්මාණය කියවන විට මට සිහිපත් වූයේ මීට අඩසිය වසකට පමණ පෙර ගුණදාස අමරසේකරයන් ලියූ 'අඳුර අපේ දුක නිවාවි' නම් වූ කවි පෙළයි.

අඳුර අනේ ළමයෙකු සේ බිය වී ඉකිබිඳ  
අඬනව  
මට තනිවට පාළු කැපූ පොත් සේරම  
සුසුම් ලනව  
තනිකම නම් රකුසකු සේ පය තබමින් ගෙට  
ඇදෙනව  
මගේ හිතේ දුක නිවන්න සිංහල කවියක්  
ගොතනව

(පර්ත් නුවර ජන කවි පිට - 38)

සුනිල්ගේ කාව්‍ය සංග්‍රහය පුරා පැතිර ඇති දුලබ ගුණයක් නම් එදා මෙදාතුර ඔහුගේ නිර්මාණ දිවි පෙවෙතට අතහිත දුන් හැම දෙනෙකු මෙන් ම ස්වකීය සමකාලීන කවි මිතුරන් සැමට උස්මිටි භේදයකින් තොරව ප්‍රණාමය දැක්වීමට ඔහු දරා ඇති ප්‍රයත්නයයි. එකම ක්ෂේත්‍රයේ නිර්මාණයේ යෙදෙන සහෝදර නිර්මාණකරුවන්ට මං අහුරන සමාජ පරිසරයක හැදුන වැඩුන අප බොහෝ දෙනෙකුට සුනිල්ගේ මේ ගුණාංගය ඉතා දුර්ලභ මහත්මා ගතියක් ලෙස පෙනීයාම අරුමයක් නොවේ. එම ගුණාංගයට යටින් ඇති නිහතමානය විශිෂ්ට කවියකු සතු මූලික ලක්‍ෂණයකි. සුනිල් ගොවින්නයන්ගේ මේ විශිෂ්ට ගුණය ඔහු තුළින් අනාගතයේදී විශිෂ්ට නව නිර්මාණ බිහිවීමට හේතුසාදක වන බව මට විශ්වාසය.

මේ කෙටි සටහන 'මතක පිළිරුව' කාව්‍ය සංග්‍රහය පිළිබඳ විවේචනයක් නොවේ. එය වූ කලි සංවේදී හදවතක් ඇති කවියකුගේ හා සුහද මිතුරකුගේ හා සුහද මිතුරකුගේ නිර්මාණයක් කියවීමේදී සිතට නැගුණු ප්‍රහර්ෂය වැමෑරීමක් ලෙස සැලකුව මනාය.







